C
377
PER

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# චිත්තවේග සංස්කරණය සඳහා අධ්‍යාපනය හා ශ්‍රී ලංකාවේ කනිෂ්ඨ ද්විතීයික පාසල් විෂයමාලාව

( 6, 7, 8 වසර බුද්ධ ධර්මය පෙළපොත් ආශ්‍රිත සංධාර විශ්ලේෂණයක් )

# Education of the Emotions and the Junior Secondary School Curriculum in Sri Lanka.

( An Analysis of Textbooks in Buddhism
in year 6, 7 and 8 )

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

කේ. එම් ටී. ලලිතා පෙරේරා ,
B.A.( special ), Dip. in Education ( Distinction )

අධ්‍යාපන දර්ශනපති උපාධි නිබන්ධනය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය
ශ්‍රී ලංකාව

1997

පර්යේෂණ උපදේශක
ආචාර්ය එල්. ඒ කොබ්බෑකඩුව මහත්මිය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.

UNIVERSITY OF PERADENIYA
11-9-1998
LIBRARY

# සාර සංග්‍රහය

ශ්‍රී ලංකාවේ පාසල්වල ඉගෙනුම ලබන හය, හත සහ අට වසර සිසු දරුවන් හට චිත්තවේග සංස්කරණය සඳහා අධ්‍යාපනය ලබා දීමේදී කණිෂ්ඨ ද්විතීයික පාසල් විෂයමාලාව කොතෙක් දුරට අදාළ කරගත හැකිදැයි විමසීම මෙම අධ්‍යයනයේ මූලික අභිප්‍රාය විය. කුඩා අවධියේ සිටම පුද්ගලයා විවිධ ක්‍රියාකාරිත්වයන් සඳහා මෙහෙයවනු ලබන චිත්තවේග ( emotions ) පිළිබඳව විග්‍රහ කිරීම හා චිත්තවේග සංස්කරණය කිරීම මගින් පුද්ගලයාගේ මෙන්ම සමාජයේ ද අභිවෘද්ධිය ලඟා කරගත හැකි බව තහවුරු කිරීම ද මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වී ඇත.

අධ්‍යාපන දර්ශනයේ නව නැම්මක් ලෙස හැඳින්වෙන නූතන විශ්ලේෂීය දර්ශනය තුළින් ගැඹුරු ලෙස විමර්ශනය කරන ලද 'චිත්තවේග සංස්කරණය සඳහා අධ්‍යාපනය' ( The education of the emotions ) යන සංකල්පය තේමා කොටගෙන මෙම අධ්‍යයනය සිදු කෙරිණි. දත්ත ලෙස යොදා ගැනෙනුයේ ශ්‍රී ලංකාවේ කණිෂ්ඨ ද්විතීයික පාසල් විෂයමාලාවේ ඇතුළත් බුද්ධ ධර්මය විෂය ආශ්‍රිත හය, හත සහ අට වසර පෙළපොත් වල අඩංගු විෂය කරුණුය.

විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස සැලකෙන සංධාර විග්‍රහය ( content analysis ) ක්‍රම ශිල්පය යොදා ගනිමින් අදාළ පෙළපොත් වල ඇතුළත් විෂය කරුණු විශ්ලේෂණයට යොමු කර ඇත. නූතන අධ්‍යාපන දාර්ශනිකයන් විසින් ඉදිරිපත් කර ඇති චිත්තවේග සංස්කරණ විධි හයක් සඳහා ගැළපෙන විෂය කරුණු පමණක් විග්‍රහ කෙරිණි.

ශ්‍රී ලංකාවේ කණිෂ්ඨ ද්විතීයික පාසල් විෂයමාලාව මගින්, කණිෂ්ඨ ද්විතීයික පාසල් සිසු දරුවන්ගේ චිත්තවේග සංස්කරණය සඳහා ඉටුවන මෙහෙය ප්‍රමාණවත් නොවන බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය. 'චිත්තවේග සංස්කරණය සඳහා අධ්‍යාපනය' යන සංකල්පය කෙරෙහි ශිෂ්‍යයන් යොමු කළ හැකි

අවස්ථා පිළිබඳව ප්‍රමාණවත් තරම් නිදසුන් පෙළපොත් ආශ්‍රයෙන් ඉදිරිපත් වී නොතිබීම ඉහත නිගමනයට අප එළැඹීමට හේතු කාරක වී ඇත.

අධ්‍යාපනය මගින් සමාජයට ඉදිරිපත් කෙරෙන අනාගත පුරවැසියන් තුළ උසස් මානසික ලක්ෂණ ඇති කිරීම සඳහා කනිෂ්ඨ ද්විතියික පාසල් විෂයමාලාවෙහි පමණක් නොව සමස්ත අධ්‍යාපන පද්ධතිය පුරාම මෙම සංකල්පය ව්‍යාප්ත කළ හැකි ආකාරය පිළිබඳ යෝජනා අවසන් වශයෙන් ඉදිරිපත් කෙරේ.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY